අම්බලන්ගොඩ නගර සභාව

ගාල්ල දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 23 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය වෙනුවෙන් විථි පහන් නඩත්තුව සඳහා ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු වීථි පහන් නඩත්තු දීමනා මුදල ගණනය කර ණයගැතියන් යටතේ දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.5,314,979 ක් වූ තැන්පතු වර්ගීකරණය කර දක්වා නොතිබුණි.

(ඇ) ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි මුදල් ආයෝජන සඳහා ඉකුත් වර්ෂයේ අවසන් කාර්තුව සඳහා ලැබිය යුතු පොලිය රු.41,709 ක් සමුච්චිත අරමුදලට බැර නොකර, සමාලෝචිත වර්ෂයේ ආදායමට බැර කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි එක්වන් ආදායම් මුදල රු.259,584 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.295,584 ක් ලෙස දක්වා තිබීමෙන් ණයගැති ශේෂය රු.36,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩාවේ ඉතිරිව තිබූ තොග අයිතම 33 කට අයත් ඒකක 2247 ක වටිනාකම් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඊ) රු.152,000 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 02 ක් සහ වටිනාකම ගණනය නොකළ අයිතම 01 ක් අතැති තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**1.3.3 නොසැසඳු පාලන ගිණුම්**

---------------------------

ගිණුම් විෂයයන් 03 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.2,940,228 ක වෙනසක් පැවතුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.43,212,332 ක් වූ ගනුදෙනු සම්බන්ධව යාවත්කාලීන කරන ලද ණය ලේඛනය, අත්තිකාරම් ලේඛනය, තැන්පත් ලේඛනය, ශේෂ සනාථ සහතික සහ කාල විශ්ලේෂණය පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,862,377 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 17,259,764 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**----------------------**

**2.2.1 වරිපනම් බදු**

--------------

2013 දෙසැම්බර් 31 දිනට රු.9,716,670 ක හිඟ වරිපනම් බදු ශේෂයක් පැවතියද 1988 නගර සභා ආඥා පනතේ 170(2) වගන්තිය ප්‍රකාරව දේපල තහනම් කිරීමේ ක්‍රියාමාර්ගය අනුගමනය කර හිඟ ආදායම් අයකර ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි.

**2.2.2 බදුකුලී හා වෙළඳ බලපත්‍ර ගාස්තු**

-----------------------------------

2013 දෙසැම්බර් 31 දිනට රු.2,639,196 ක කඩකුලී හා රු.109,852 ක හිඟ බලපත්‍ර ගාස්තු වශයෙන් එකතුව රු.2,749,048 ක් වූ හිඟ ආදායම් ශේෂයක් පැවතිය ද, 1988 නගර සභා ආඥා පනතේ 170(අ)1 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 1% බලපත්‍ර ගාස්තු**

**--------------------**

නගර සභා ආඥා පනතේ 164 වගන්තිය ප්‍රකාරව ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි වූ හෝටල්, ආපන ශාලා සහ ලැගුම්හල් සඳහා පෙර වර්ෂයේ ලැබීම් මත 1% ක බලපත්‍ර ගාස්තුවක් අය කළයුතු වුවත්, සභා බලප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්, ආපන ශාලා සහ ලැගුම්හල් තුනකින් 1% ක බලපත්‍ර ගාස්තු අය කරගෙන නොතිබුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු. 370,800 ක උසාවි දඩ හා රු. 29,740,525 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

### 2.3 අධිභාර

1988 නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු පුද්ගලයින්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුළ පනවන ලද අධිභාර **02** ක් සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.3,010 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) දේපල ණය සඳහා ගෙවන ලද පොලිය ප්‍රතිපූර්ණය කරවා නොගැනීම**

2005 මාර්තු 31 දිනැති අංක : 08/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 11.5 වගන්තිය අනුව දේපල ණය සඳහා බැංකු පොලී අනුපාතිකය හා නිලධාරියාගෙන් අය කරන 4% ක පොලී අනුපාතිකය අතර වෙනස රජය විසින් දරන බව දක්වා තිබුණි. සභාවේ නිලධාරීන් ලබාගෙන තිබූ දේපල ණයවලට අදාළ රු.81,887 ක දේපල ණය පොලී සභා අරමුදලින් ගෙවා තිබුණ ද, විගණන දිනය වූ 2014 ජුනි 06 දින වනවිටත් එම මුදල පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරවාගෙන නොතිබුණි.

**(ආ) සේවක ණය**

සභාවේ සේවය කරන ලද සේවකයින් 65 දෙනෙකුගෙන් අයවීම් හිඟහිටි ණය ශේෂය රු.107,190 ක් වූ අතර ඉන් 62 දෙනෙකුගේ රු.97,690 ක ණය ශේෂය 2009 වර්ෂයට පෙර සිට හිඟහිටව තිබුණි. මෙම ණය ශේෂයන් අයකර ගැනීමට සභාව විසින් විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

**(ඇ) සිතුම් සෙවන ඉඩම් වෙන්දේසිය**

තල්ගස්ගොඩ පිහිටි අක්කර 4 , රූඩ් 2, පර්චස් 4.50 ක් වූ ඉඩමක් රෝයල් සිටි නමින් කැබලි කර සංවර්ධනය කිරීම සඳහා 2008 අප්‍රේල් 04 දින සභාව විසින් මූල්‍ය සමාගමක් වෙත සංවර්ධන බලපත්‍රයක් ලබා දී තිබුණි.

2009 අප්‍රේල් 17 දිනැති හා අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් පනවා ඇති නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යවරයාගේ නියෝග අනුව සංවර්ධනය කරන ලද ඉඩම් වෙන්දේසි කිරීමට පෙර අනුකූලතාවය ලබා ගතයුතු වුවද, එසේ අනුකූලතාවය ලබා ගැනීමකින් තොරව මෙම ඉඩමේ කැබලි 54 ක් වෙන්දේසි කර තිබුණි. මේ අනුව අනුකූලතා ගාස්තු ලෙස සභාවට ලැබිය යුතු රු.27,500 ක ආදායම අහිමි වී තිබූ අතර, අනුකූලතා සහතිකයක් නොමැතිව වෙන්දේසි කිරීම නිසා 2014 ජුනි 05 දින දක්වා අය කළයුතු දඩ මුදල රු.93,000 ක් විය.

**(ඇ) අගරු චෙක්පත්**

**------------------**

2010 මැයි 10 දින දේපල තහනම් කිරීමේ නිලධාරී විසින් සභාව වෙත ලබා දී තිබූ රු.10,285 ක් වූ චෙක්පතක් අගරු වී තිබුණ ද, විගණන දිනය වූ 2014 ජුනි 06 දින වන විටද එකී මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 නිශ්ක්‍රීය වත්කම්**

------------------

ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ අපහරණය පිළිබඳ ජනාධිපති ලේකම් විසින් 2013 ජුනි 05 දින නිකුත් කරන ලද අංක : PCMD/PR/2013 දරන චක්‍රලේඛය පරිදි රජයේ ආයතන තුළ ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ 2013 සැප්තැම්බර් 05 දින වනවිට අපහරණය කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙසට දන්වා තිබුණි. සභා භූමිය තුළ එකතු වටිනාකම රු.692,990 ක් වූ ත්‍රීරෝද රථයක්, අත් ට්‍රැක්ටරයක්, ට්‍රේලරයක් සහ කැබ් රථයක් දිරාපත් වෙමින් පවතින බව 2014 ජුනි 06 දින සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ නමුත් ඒ පිළිබඳ චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කර නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඉ) වත්කම් කළමනාකරණය